SJSD 2022 2(2): 25 - 42

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELOPEMENT** (SJSD)
**Volume 02 – Issue 02**

DOI: https://doi.org/10.4038/sljsd.v2i2.27

# ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, සමාජ වැඩ පරිචය භාවිතා කරමින් සිදු කළ හැකි සාධනීය නවීකරණ පිළිබඳ අධ්‍යයනය (උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අනුරාධපුර අභය ළමා නිවස ඇසුරෙන්)

# A Study on Constructive Reforms that Can Be Made Using Social Work Perspective Regarding the National Policy on Alternative Care for Children in Sri Lanka (With Special Reference to Abhaya Children's Home in Anuradhapura under the Department of Probation and Childcare Services, North Central Province)

**Panawanna E. R.**[1],

[1]Attorney-at-Law

## Abstract

In Sri Lanka, each of the nine provinces has established one residential care home for the custody of orphans, destitute, and abandoned children from birth up to the age of five. These institutions operate under the respective Provincial Departments of Probation and Childcare Services. The primary objective of this study is to identify possible constructive reforms to these residential care homes using a social work perspective.The study focuses on the Abhaya Children's Home in Anuradhapura, which operates under the North Central Province's Department of Probation and Childcare Services. Qualitative data were collected through a case study conducted at this institution and analyzed using social work theories, principles, and evaluations. Based on the National Policy on Alternative Care for Children in Sri Lanka, implemented since 2019, the study reveals that reforms are necessary in the institution, its staff, and administrative practices.

**Key Words:** *Residential Care Homes, Social Work, National Policy on Alternative Care for Children in Sri Lanka*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය මත පදනම් ව, පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන උපතේ සිට වයස අවුරුදු පහ දක්වා දරුවන් භාර ගැනීමේ නිවාස සම්බන්ධයෙන්, මෙම අධ්‍යයනය සිදු කළ අතර, ඒ සඳහා සමාජ වැඩ න්‍යායයන්, මූලධර්ම හා ඇගයුම් භාවිතා කරන ලදි. මෙහි සමාජ වැඩ යනු, පුද්ගල නිදහස, බල ගැන්වීම හා සමාජ ඒකාබද්ධතාව, සමාජ වෙනස හා සංවර්ධනය ප්‍රවර්ධනය කරන ශාස්ත්‍රීය විෂයයක් මෙන් ම, ප්‍රායෝගික වෘත්තියකි. සමාජ සාධාරණත්ව මූලධර්ම, මානව අයිතිවාසිකම්, සාමූහික වගකීම හා විවිධත්වයට ගරු කිරීම සමාජ වැඩ වල කේන්ද්‍රීය සාධක වේ. සමාජ වැඩ පිළිබඳ න්‍යායයන්, සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර හා දේශීය දැනුම මත පදනම් ව, සමාජ වැඩ ජීවන අභියෝග ආමන්ත්‍රණය කරමින්, මානව සුබසාධනය පුළුල් කිරීම සඳහා පුද්ගලයන් හා සංවිධාන සමඟ කටයුතු කරයි (IFSW, 2021). ඒ අනුව, සමාජ වැඩ, පුද්ගලයාගේ පුද්ගල මෙන් ම සමාජ සුබ සාධනය හා සුබ සිද්ධිය සාර්ථක ව පවත්වා ගෙන යාමට හෝ එය කිසියම් ආකාරයකින් තව දුරටත් ඉහළ නැංවීම සඳහා, පුද්ගල මට්ටමෙන්, පවුල්, කුඩා කණ්ඩායම් මට්ටමෙන් හෝ ප්‍රජා මට්ටමෙන් මැදිහත් වී කරනු ලබන උපකාරක ක්‍රියාවලියක් ලෙස සරල ව, පෙන්වා දිය හැකි අතර, මෙම මැදිහත් වීම සංවිධානාත්මක හා විධිමත් දැනුමක් මත පදනම් වූ ක්‍රමවේද භාවිතා කරන හැකියා/ නිපුණතා අවශ්‍ය වන අඟනාකම්, මූලධර්ම හා ආචාර ධර්ම පද්ධතියක් මත පදනම් වූ වෘත්තීමය ක්‍රියාවලියකි (ගම්ලත් හා අමරසේකර, 2019). ඉහත සමාජ වැඩ පසුබිම තුළ මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙමින්, අයිතීන් මුල් කර ගත් ප්‍රවේශය මෙන් ම, ආයතනයේ ශක්‍යතා හා ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් ශක්තීන් මුල් කර ගත් ප්‍රවේශයත් භාවිතා කරන ලදි.

ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ න්‍යායය, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විසින් පුද්ගල සංවර්ධනය පිළිබඳ ව ඉදිරිපත් කරන ලද මනෝ-ලිංගික සංවර්ධන න්‍යායය, එරික් එරික්සන්ගේ මනෝ- සමාජීය සංවර්ධන අවධි න්‍යායය, යූරි බ්‍රොන්ෆෙන්බ්රෙනර් විසින් ඉදිරිපත් කරන ලද පාරිසරික පද්ධති න්‍යායය, ලෝරන්ස් කෝල්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද සදාචාරත්මක සංවර්ධන න්‍යායය වැනි සමාජ වැඩ පරිචය තුළ භාවිතා වන න්‍යායයන් ද සිද්ධිය විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදි.

## සාහිත්‍ය විමර්ශනය

### ආයතනය හැඳින්වීම

උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන මෙම අභය ළමා නිවස අනුරාධපුර කේ. බී. රත්නායක මාවතේ පිහිටා ඇති අතර වයස අවුරුදු 0-5 දක්වා වයස් කාණ්ඩයට අයත් අනාථ, අසරණ හා අත් හළ දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සුරක්ෂිතභාවය ඇති කිරීමේ අරමුණින්, එවැනි දරුවන් භාර ගැනීමේ නිවසක් ලෙස ක්‍රියාත්මක වේ. ආයතනයේ සිටින දරුවන් සමාජ ගත කිරීම, කුල වද්දා ගැනීම (Adoption) හෝ වෙනත් විකල්ප රැකවරණ ක්‍රමවේද වෙත යොමු කිරීම මෙම ආයතනය මඟින් සිදු කරන අතර, දැනට දරුවන් 24 දෙනෙක් හා ළමා මවක් ආයතනයේ රැකවරණය ලබයි. ආයතනයේ ප්‍රධානියා ලෙස උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් කටයුතු කරයි. දුරකථන අංක 0254428613 හරහාත්,

ෆැක්ස් අංක 0252222570 හරහාත්, probationncp633@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහාත් අභය ළමා නිවස සමඟ ඍජු ව සම්බන්ධ විය හැකි ය.

## ආයතනය ආරම්භ කළ ආකාරය

වර්ෂ 1930 දී පමණ, ශ්‍රී ලංකාවේ අධිකරණය විසින්, පරිවාස ක්‍රමය අත් හදා බැලීම ආරම්භ කරන ලද අතර, පසුව, 1944 අංක 22 දරන පරිවාස ආඥා පනත මඟින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමඟ එක්ව පරිවාස සේවා ආරම්භ විය. අධිකරණය විසින් පරිවාස සේවය පිළිගැනීමෙන් පසු, සේවාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව මතු වූ අතර, ළමා හා ගැටවර ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟ ළමයින් සඳහා සැපයෙන සේවා එක්තැන් කිරීමේ අවශ්‍යතාව ද මතු විය.

ඒ අනුව, 1956 ඔක්තෝබර් මස 01 වන දින පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය. මෙම දෙපාර්තමේන්තුව යටතේ, භාර ගැනීමේ නිවාස, ළමා රැඳවුම් නිවාස, සහතික කළ පාසල් ඇතුළු අනෙකුත් ආයතන ආරම්භ කොට පවත්වා ගෙන ගිය අතර, මුළු දිවයින ම ආවරණය වන පරිදි, සහකාර කොමසාරිස්වරුද, පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට සහාය වීම සඳහා පත් කරන ලදි.

1987 වසරේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ මෙම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස් ට සහාය වූ සහකාර කොමසාරිස් තනතුරු අහෝසි වූ අතර, පළාත් සභා යටතේ, පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරු සියලු පළාත් වෙනුවෙන් පත් වූ අතර, පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්ෂණයට යටත් විය.

මෙම ක්‍රියාවලිය තුළ, 1941 අංක 22 දරන අනත් දරු ආඥා පනතේ (Orphanages Ordinance) 14 වන වගන්තියේ විධි විධාන ප්‍රකාර ව අභය ළමා නිවස, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ 1978 වසරේ දී ආරම්භ කොට පවත්වා ගෙන ගිය අතර, 1988 වසරේ සිට, උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ.

## ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

අරමුණ - අනාථ, අසරණ, අත් හළ දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සුරක්ෂිතභාවය ඇති කිරීම

දැක්ම - ආයතන ගත වන දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය, සුරක්ෂිතභාවය තහවුරු කිරීම හා තම නිවසේ පරිසරය සතුටුදායක වන තෙක් හෝ සුදුසු දෙමාපිය යුවළකට කුල වද්දන තෙක් දරුවන්ට සතුටුදායක පරිසරයක් ඇති කිරීම

මෙහෙවර - ආයතනයට ඇතුළත් වන දරුවන්ගේ උපරිම සුබ සිද්ධිය අරමුණු කර ගත් සුරක්ෂිත ළමා පරිසරයක් බිහි කිරීම

අනාථ, අත් හළ හා අසරණ ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා දරුවා කේන්ද්‍ර කොට ගෙන, දයාව/කරුණාව පෙරදැරි කර ගෙන සහයෝගී ප්‍රවේශයක් තුළ මනා කැපවීමෙන් කටයුතු කිරීම අරමුණු කොට ගත්,මධ්‍යම රජයට අයත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරන සියලු ම පාර්ශව කරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාවලියක් හරහා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම අරමුණු කර ගනිමින් කටයුතු කරන උතුරු මැද පළාත් පරිවාස

හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අභය ළමා නිවසෙහි අරමුණ, දැක්ම හා මෙහෙවර ඉහත සඳහන් පරිදි වේ.

ඉහත සඳහන්, අභය ළමා නිවස විසින් වග කිව යුතු ඉහළ ආයතන වල අරමුණු, දැක්ම හා මෙහෙවර යථාර්ථයක් බවට පත් කිරීම සඳහා වන ප්‍රායෝගික වැඩ පිළිවෙළ අභය ළමා නිවසෙහි අරමුණ, දැක්ම හා මෙහෙවර තුළ අඩංගු වන බව මේ අනුව පැහැදිලි වේ. එනම්, ආයතනයට ඇතුළත් කර ගන්නා 0-5 වයස් කාණ්ඩයට අයත් අනාථ, අසරණ, අත් හළ දරුවන්ගේ උපරිම සුබ සිද්ධිය අරමුණු කර ගනිමින්, ආයතනයේ රැඳී සිටින කාලය තුළ දරුවන්ට සතුටුදායක පරිසරයක් ඇති කරමින්, එම දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සුරක්ෂිතභාවය ඇති කිරීම මෙම ආයතනය හරහා සිදු කිරීම ට අපේක්ෂිත බව ආයතනයේ අරමුණ, දැක්ම හා මෙහෙවර මඟින් පැහැදිලි වේ.

## ආයතනයේ පරිපාලනය

පහත රූප සටහන 1හි ආයතනයේ පරිපාලන ව්‍යුහය පැහැදිලි ව දක්වා ඇති අතර, අභය ළමා නිවසෙහි භාරකාරත්වය ප්‍රධාන පාලිකාව සතු වන අතර, ඇය විසින්, නිවාස මාතාවන් හා ව්‍යුහයේ ඊට පහළින් ස්ථාන ගත අනෙකුත් නිලයන් සමඟ අභය නිවස පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි. ළමයින් සමාජ ගත කිරීම සඳහා පවත්වන ස්ථාපන කමිටු හා දරුවන් කුල වද්දා ගැනීම සඳහා පවත්වන කුල වද්දා ගැනීමේ කමිටු සඳහා ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි හා පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ඇතුළු පාර්ශව කිහිපයක් සම්බන්ධ වන අතර, ආයතනයේ අධීක්ෂණ කටයුතු අධීක්ෂණ නිලධාරි විසින් සිදු කරනු ලැබේ.

පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්

ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි

අධීක්ෂණ නිලධාරි

ප්‍රධාන පාලිකා

නිවාස මාතා

අරක්කැමි

මුර කරු /කම්කරුරූප සටහන -1 - අභය ළමා නිවාසයේ පරිපාලන ව්‍යුහය

## ආයතනය මඟින් සිදු කරන ක්‍රියාකාරකම්

1. වයස අවුරුදු 0-5 අතර අනාථ, අසරණ, අත් හළ දරුවන් භාර ගැනීම හා පහසුකම් සැපයීම

පළමුවෙන් ම, අභය ළමා නිවස මඟින් වයස අවුරුදු 05ට අඩු දරුවන් අධිකරණ නියෝග මත හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ අනුමැතිය මත ඇතුළත් කර ගන්නා අතර, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, අධ්‍යාපනය හා සුරක්ෂිතභාවය ඇතුළු සියලු ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. එනම්, මෙම දරුවන් සඳහා අවශ්‍ය ආහාර පාන, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම්, ඇඳුම් පැළඳුම් මෙන් ම, නින්ද, විවේකය, ආරක්ෂාව හා රැකවරණය ආයතනය මඟින් සපයනු ලබයි.

එමෙන් ම, වයස අවුරුදු 0-5 දක්වා වන දරුවන් රැඳී සිටින බැවින් එම දරුවන්ට තම එදිනෙදා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා රැකවරණය සපයන්නෙකුගේ උපකාරය අවශ්‍ය වන අතර, දරුවන් පිරිසිදු කිරීම, ඔවුන්ට ආහාර පාන ලබා දීම, ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් පිරිසිදු කිරීම, දරුවන් නින්දට යැවීම ඇතුළු සියලු කාර්යයන් වල දී අදාළ නිලධාරීන්ට ඒ සඳහා මැදිහත් වීමට සිදු වේ.

2. පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය

මෙම ආයතනය තුළ පෙර පාසලක් පවත්වා ගෙන යනු ලබන අතර, පූර්ව ළමා විය සංවර්ධනය සම්බන්ධයෙන් අවධානය යොමු කොට ඇති බව පැහැදිලි වේ. එනම්, පෙර පාසල් දරුවන් සඳහා වාර්ෂික විවිධ ප්‍රසංගයක් මෙම ආයතනය මඟින් සංවිධානය කරන අතර, පෙර පාසල් දරුවන්ගේ අත්කම් ප්‍රදර්ශනයක් ද පවත්වයි. ආයතන අධ්‍යයන අවස්ථාවේ දී, දරුවන්ගේ පෙර පාසල නැරඹීමට අවස්ථාව හිමි වූ අතර, පෙර පාසල දරුවන් ප්‍රිය කරන විසිතුරු වර්ණ වලින් සමන්විත විය. එමෙන් ම, දරුවන්ගේ අත්කම් බිත්ති මත අලවා ප්‍රදර්ශනය කොට තිබුණු අතර, පෙර පාසල් දරුවන් සඳහා අධ්‍යාපන චාරිකා ද සංවිධානය කරන බව ප්‍රකාශ කරන ලදි.

3. ස්ථාපන කමිටු හා කුල වැද්දීමේ කමිටු

ළමුන් සමාජගත කිරීම සඳහා ස්ථාපන කමිටු ක්‍රියාත්මක වන අතර, දරුවා මවට, පියාට හෝ භාර කරුවෙකුට භාර දීම සඳහා මෙමඟින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව, පරිවාස නිලධාරි විසින් දරුවා භාර ගැනීමට ඉදිරිපත් වන පුද්ගලයන් හෝ පුද්ගලයා සම්බන්ධයෙන් නිවාස චාරිකා ද ඇතුළත් ක්ෂේත්‍ර විමර්ශනයක් සිදු කරන අතර, දරුවා සම්බන්ධයෙන් දරුවාගේ පවුල් පරිසරය තුළ පැවති අනාරක්ෂිත බව පහ ව ගොස් තිබේ ද නැද්ද, දරුවා එම පාර්ශවයට භාර කිරීම සුදුසු ද නැද්ද ආදිය සම්බන්ධයෙන් නිර්දේශ මෙම කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

ළමුන් කුල වැද්දීම සඳහා කුල වැද්දීමේ කමිටු පවත්වනු ලබන අතර, විශේෂයෙන් ම, මෙම කුල වැද්දීමේ කමිටු සෑම මාස තුනකට ම වරක්, අමාත්‍යංශ ලේකම්, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ කොමසාරිස්, ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි හා වෛද්‍ය නිලධාරි යන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලැබේ. උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන, එක් එක් අධිකරණ බල ප්‍රදේශයට අදාළ ව පිහිටුවා ඇති පරිවාස කාර්යාල වලට විවාහක අඹු-සැමියන් විසින් දරුවන් හදා වඩා ගැනීමට දරුවන් ලබා ගැනීම සඳහා සිදු කරන ඉල්ලීම් හරහා, දරුවන් කුල වද්දා ගැනීමට යොමු කළ හැකි විවාහක අඹු- සැමි යුවළක් තෝරා ගැනීම සිදු කෙරෙයි.

මෙහි දී, පරිවාස නිලධාරි විසින් දරුවෙකු කුල වද්දා ගැනීමට අපේක්ෂා කරන පවුල් පිළිබඳ ව නිවාස චාරිකා ද ඇතුළත් ක්ෂේත්‍ර විමර්ශනයක් සිදු කරන අතර, පරිවාස නිලධාරි විසින් සුදුසු පවුල් නිර්දේශ කරයි. එම පවුල් ඇතුළත් පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන යන අතර, එම පවුල් අතරින් වඩාත් සුදුසු ම පවුල ට, දරුවෙකු කුල වද්දා ගැනීමට අවස්ථාව ලබා දෙයි. දේශීය කුලවද්දා ගැනීම් මෙන් ම, විදේශීය කුලවද්දා ගැනීම් ද මෙහි දී සිදු වේ.

නමුත්, ආයතන ගත වන සියලු දරුවන් කුල වද්දා ගැනීම සඳහා යොමු කිරීමට හැකියාවක් නොමැති අතර, ප්‍රධාන වශයෙන්, දරුවෙකු කුල වද්දා ගැනීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට නම්, දරුවාගේ මව හා/හෝ පියා හෝ දෙමාපියන් නොමැති නම් දරුවාගේ භාරකරු යන අයගෙන් ලිඛිත ව කැමැත්ත ප්‍රකාශ කරන ලේඛනය හා CF 83 පෝරමය සම්පූර්ණ කොට භාර දීම අත්‍යාවශ්‍ය ය. එම ලේඛන ඉදිරිපත් නො කරන දරුවන් කුල වද්දා ගැනීමේ ක්‍රියාවලිය ට යොමු කළ නො හැකි අතර, DNA පරීක්ෂණයට යොමු කිරීම වැනි අධිකරණමය කටයුතු වලට මැදිහත් වූ දරුවන් ද කුල වද්දා ගැනීම සඳහා යොමු කළ නො හැකි ය.

4. වයස අවුරුදු 5 සම්පූර්ණ වූ දරුවන්ට සුදුසු ආයතනයක් ලබා දීම

ඉහත විස්තර කළ ආකාරයට කුල වද්දා ගැනීමට හෝ සමාජ ගත කිරීමට, එනම්, දෙමාපියන් ට, පවුලේ ඥාතීන්ට හෝ භාර කිරීමට නො හැකි වූ දරුවන් වයස අවුරුදු 5 සම්පූර්ණ වූ පසු සුදුසු වෙනත් විකල්ප රැකවරණ මධ්‍යස්ථාන වලට ඇතුළත් කරන අතර, පාසල් අධ්‍යාපනයට යොමු කිරීම පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබේ. ආබාධ සහිත දරුවෙකු නම්, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන ආයතනයකට සම්බන්ධ කරනු ලැබේ.

5. දරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම

මෙම ආයතනයට ප්‍රධාන වශයෙන් දරුවන් යොමු කරනු ලබන්නේ, අධිකරණ නියෝග හරහා වන අතර, එවැනි දරුවන් නැවත නැවතත් අධිකරණ නියෝගය මත අධිකරණයට ඉදිරිපත් කිරීමට සිදු වේ. එවැනි අවස්ථා වල, දරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා දරුවන්ට පහසුකම් සැපයීම මෙම ආයතනය විසින් සිදු කරන අතර, විශේෂයෙන් ම, කුඩා දරුවන් වන බැවින් මේ සඳහා නිලධාරීන් ට මැදිහත් වීමට සිදු වේ.

6. දරුවන් රෝගී වූ අවස්ථා වල රෝහල් ගත කිරීම හා වෛද්‍ය සායන සඳහා රැගෙන යාම

7. උප්පැන්න සහතික නොමැති දරුවන් සඳහා උප්පැන්න සහතික හෝ අනුමාන වයස් සහතික සැකසීම

3.6. ආයතනයේ සේවා ලබා ගැනීමේ නිර්ණායක / ඉලක්ක කණ්ඩායම් හා ආයතනයේ යෝග්‍යත්වය

ඉහත විස්තර කළ ආකාරයට, වයස අවුරුදු 0-5 දක්වා අනාථ, අසරණ, අත් හළ දරුවන් වෙනුවෙන් අභය ළමා නිවස ආරක්ෂාව, රැකවරණය, සුරක්ෂිතභාවය තහවුරු කිරීම සිදු කරයි. ඒ අනුව, ආයතනයේ සේවය ලබා ගන්නා කණ්ඩායම / ඉලක්ක කණ්ඩායම, වයස අවුරුදු 0-5 දක්වා දරුවන් වන අතර, ඒ සඳහා සලකා බලන නිර්ණායක ලෙස එම දරුවන් අනාථ, අසරණ, අත් හළ දරුවන් වීම හඳුනා ගත හැකි ය.

මීට අමතර ව, උතුරු මැද පළාත ට අදාළ ව, ළමා මව්වරු රැක බලා ගැනීම සම්බන්ධයෙන් ආයතනයක් නොමැති නිසා, ළදරුවා සමඟ ළමා මව්වරු රැක බලා ගැනීම සඳහා මෙම ආයතනය වෙත යොමු කරන අතර, ඒ අනුව, මෙම ආයතනය විසින් සේවය ලබා ගන්නා

තවත් කණ්ඩායමක් ලෙස ළමා මව්වරු හඳුනා ගත හැකි ය. ක්ෂේත්‍ර අධ්‍යයනය තුළ හඳුනා ගන්නා ලද අකාරයට, එම ආයතනය තුළ දැනට එක් ළමා මවක් රැඳී සිටින අතර, මීට පෙර ළමා මව්වරු 5-6 අතර සංඛ්‍යාවක් රැඳී සිටි පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සමාජ ගත කිරීම හෝ නිවාස ගත කිරීම සිදු කොට තිබේ.

ආයතනයේ යෝග්‍යත්වය පිළිබඳ සලකා බැලීමේ දී, දැනට නිලධාරීන් 14 දෙනෙකු විසින් දරුවන් 24 දෙනෙකු රැක බලා ගන්නා අතර, ඒ අනුව, සේවක හිඟය හේතුවෙන් මෙන් ම, අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන්ට ළමා රැකවරණය සම්බන්ධයෙන් පුහුණුවක් හෝ ලබා දීමට අසමත් වීම නිසා, ඒ අනුව, පුහුණු නිලධාරීන් ගේ හිඟය හේතුවෙන් ද ආයතනයේ යෝග්‍යත්වය පිළිබඳ ගැටළු මතු වී ඇති බව හඳුනා ගත හැකි ය. කෙසේ නමුත්, මෙම ආයතනය හරහා රැකවරණය අහිමි දරුවන්ට රැකවරණය සැලසීම, දෙමාපියන් නොමැති දරුවන්ට කුල වැද්දීම තුළින් සුදුසු දෙමාපිය යුවළක ගේ ආදරය, ආරක්ෂාව, රැකවරණය යටතේ හැදී වැඩීමට අවස්ථාව සලසා දීම මෙන් ම, පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දරුවන් සමාජ ගත කිරීම ද  අගය කළ යුතු ය.

### 3.7. ආයතනය මුදල් සම්පාදනය කර ගන්නා ආකාරය

උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන රජයේ ආයතනයක් වන බැවින්, අදාළ දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිපාදන හිමි වේ. ඊට අමතර ව, දරුවන් සඳහා ආහාර වේල් හා වෙනත් පරිත්‍යාග ලබා දීමට බාහිර ඉල්ලුම්කරුවන් වෙත අවස්ථාව ලබා දී තිබේ.

## 4. අරමුණ

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන උපතේ සිට වයස අවුරුදු පහ දක්වා දරුවන් භාර ගැනීමේ නිවාස සම්බන්ධයෙන්, සමාජ වැඩ පරිචය භාවිතා කරමින් සිදු කළ හැකි සාධනීය නවීකරණ හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## 5. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය තුළ ආයතනයක් (අනුරාධපුර අභය ළමා නිවස) සම්බන්ධයෙන් ගැඹුරින් අධ්‍යයනය කිරීම තෝරා ගත් බැවින් හා සිද්ධියේ ස්වභාවය නිවැරදි ව හඳුනා ගැනීම ට ප්‍රමාණවත් තොරතුරු අවශ්‍ය වූ බැවින්, සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය (සුබසිංහ, 2016) භාවිතා කරන ලදි.

සහභාගීත්ව නොවන නිරීක්ෂණය හා ආයතනයේ නිලධාරීන් සමඟ කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හරහා ආයතනය පිළිබඳ ප්‍රාථමික දත්ත රැස් කරන ලද අතර, ඊට අමතර ව, දුරකථනය ඔස්සේ ආයතනයේ නිලධාරියෙකු සමඟ සම්බන්ධ වී තව දුරටත් ප්‍රාථමික දත්ත එක් රැස් කර ගන්නා ලදි.

එමෙන් ම, ආයතන ප්‍රධානියාගේ අවසරය මත, ආයතනයේ ලොග් සටහන් පරික්ෂා කිරීම ට අවස්ථාව ලබා ගන්නා ලද අතර, එමගින් ද ප්‍රාථමික දත්ත ලබා ගැනීමට හැකි විය. ද්වීතික දත්ත එක් රැස් කරන ලද්දේ අන්තර්ජාලය භාවිතයෙනි.

## 6. ප්‍රතිඵල හා සාකච්ඡා

මෙහි දී, ආයතනය තුළ හඳුනා ගත් ශක්‍යතා හා ගැටලු සම්බන්ධයෙන් මෙන් ම, ඒ සඳහා යෝජනා කරන නවීකරණ පිළිබඳ ව සාකච්ඡා කරනු ලැබේ.

### 6.1. ආයතනය තුළ හඳුනා ගත් ශක්‍යතා

1. රැකවරණය අහිමි දරුවන්ට රැකවරණය සැලසීම

2. දෙමාපියන් නොමැති දරුවන්ට කුල වැද්දීම තුළින් සුදුසු දෙමාපිය යුවළක ගේ ආදරය, ආරක්ෂාව, රැකවරණය යටතේ හැදී වැඩීමට අවස්ථාව සලසා දීම

3. පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දරුවන් සමාජ ගත කිරීම

### 6.2. ආයතනය තුළ හඳුනා ගත් ගැටලු

1. අධිකරණ නියෝග මත ළමා මව්වරු ඇතුළත් කිරීම

ශ්‍රී ලංකා සමාජය තුළ වර්තමානයේ මතු ව ඇති බරපතල සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා මව්වරු ඉහළ යාමේ ප්‍රවණතාව ( Teenage pregnancies on the rise in Sri Lanka, n.d.) හඳුනා ගත හැකි අතර, එහි ම දිගුවක් ලෙස ළමා මව්වරුන් හා ඔවුන්ගේ දරුවන් සඳහා රැකවරණය සැපයීමේ ගැටලුව මතු වී තිබේ. ඒ අනුව, උතුරු මැද පළාත තුළ, ළමා මව්වරු සඳහා රැකවරණය සැලසීමට පහසුකම් සහිත ආයතනයක් නොමැති අතර, අධිකරණ නියෝග මත අභය ළමා නිවසට, ළමා මව්වරු හා ඔවුන්ගේ දරුවන් ඇතුළත් කරනු ලැබේ. නමුත්, මෙම ආයතනය තුළ සේවය කරන නිලධාරීන්, වයස අවුරුදු 0-5 අතර දරුවන්ට රැකවරණය ලබා දීම සඳහා පුහුණුව හා අත්දැකීම් ලබා ගත් පිරිසක් බැවින්, නව යොවුන් වියේ පසු වන ගැහැණු දරුවන් සමඟ, විශේෂයෙන් ම, කායික හා මානසික වශයෙන් පීඩාවට පත් ව සිටින දරුවෙකුට උපත දුන් තවත් දැරියක සමඟ කටයුතු කිරීම අභියෝගාත්මක විය හැකි අතර, එම ස්ථානයේ රැඳී සිටින දරුවන්ට ද ගැටළු සහගත විය හැකි ය. ඒ අනුව, ළමා මව්වරුන් හා ඔවුන්ගේ දරුවන් සඳහා වෙනත් රැකවරණය ලබා දෙන ආයතනයක් නොමැති වීම ගැටලුවක් ලෙස හඳුනා ගත හැකි ය.

2. දරුවන් සඳහා පවතින යටිතල පහසුකම් හා ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නො වීම

ආයතන අධ්‍යයනයේ දී නිරීක්ෂණය වූ ආකාරයට, මෙම ආයතනයේ දරුවන් ආරක්ෂිත ලෝහ වැටකින් ආවරණය කරන ලද, කුඩා ප්‍රමාණයේ ඇඳක ස්ථාන ගත කර තිබෙන ආකාරය දැකිය හැකි වූ අතර, සමහර දරුවන් ඒ මත නින්දට වැටී සිටි අතර, සමහර දරුවන් එම වැට අල්ලා ගෙන නැගී සිටිමින් පැමිණි පිරිස නරඹන ආකාරය ද දැකිය හැකි විය. ඒ අනුව, එම දරුවන්ගේ නිදහස සීමා වී ඇති බව හඳුනා ගත හැකි වූ අතර, තවත් කුඩා දරුවෙකු කෘමියෙකුගේ සපා කෑමට ලක් වීම හේතුවෙන් ශරීරය පුරා රතු පැහැති පලු සහිත ව සිටින ආකාරය නිරීක්ෂණය කළ හැකි විය.

එමෙන් ම, දරුවන්ට ක්‍රීඩා කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් එම ආයතන පරිශ්‍රය තුළ දැකිය නො හැකි අතර, ක්‍රීඩා භාණ්ඩ වල හිඟයක් ද දැකිය හැකි විය. එමෙන් ම, එම අවස්ථාවේ දී, වයස අවුරුදු 0-5 අතර දරුවන් වන බැවින්, එක දරුවෙකුට එක රැකවරණය සපයන්නෙක් බැගින් හෝ අවම වශයෙන්, දරුවන් දෙදෙනකුට එක

රැකවරණය සපයන්නෙකු හෝ සිටිය යුතු වුවත්, දරුවන් 15 ක් පමණ සංඛ්‍යාවකට දරුවන් රැක බලා ගන්නා පුද්ගලයන් දෙදෙනෙකු පමණක් සිටින බව නිරීක්ෂණය කළ හැකි විය. ඒ අනුව, දරුවන් සඳහා ආයතනයේ පහසුකම් ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ.

එමෙන් ම, මෙම ආයතනය හරහා, දරුවන් අධිකරණ නියෝග මත අධිකරණයට ඉදිරිපත් කිරීම, දරුවන් රෝහලට රැගෙන යාම හා රෝහලේ සායන සඳහා සහභාගී කරවීම ඇතුළු කාර්යයන් රාශියක් ඉටු කරන නමුත්, ඒ සඳහා ආයතනය සතු ව නිල රථයක් නොමැති වීම හේතුවෙන් කුඩා දරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය දුෂ්කරතාවට පත් ව සිටින අතර, ආයතනයෙන් දරුවන් වෙනුවෙන් සැපයෙන සේවා වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ව සැපයීම සඳහා බාධාවක් ලෙස හඳුනා ගත හැකි ය.

මෙහි දී, ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ න්‍යායය ( Mcleod, 2020) වැදගත් වන අතර, ඔහුට අනුව, පුද්ගලයෙකුගේ කායික අවශ්‍යතා පළමු ව තෘප්ත විය යුතු අතර, කායික අවශ්‍යතා තෘප්ත වූ පසුව ආරක්ෂක අවශ්‍යතා තෘප්ත වීම සිදු වේ. අනතුරු ව, ආදරය හා හිමිකාරිත්වය පිළිබඳ අවශ්‍යතා තෘප්ත වන අතර, එම අවශ්‍යතා තෘප්ත වීමෙන් පසුව, ආත්ම සම්මානය, ආත්ම සාක්ෂාත්කරණය යන අවශ්‍යතා ඉටු වේ. සෑම පුද්ගලයෙකු ම එවැනි ඉහළ ස්ථර දක්වා ගමන් නො කරන බව මාස්ලෝ පෙන්වා දෙන නමුත්, පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා ඉටු වීම අත්‍යාවශ්‍ය ය.

ඒ අනුව, වයස අවුරුදු 5 ට අඩු දරුවෙකු ට තම සංවර්ධනය සඳහා ඇති අයිතිවාසිකම ගරු කරමින්, සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට ආයතනය සමත් විය යුතු බව පැහැදිලි අතර, දරුවෙකුට, රෝහලට හෝ අධිකරණයට යාමට පහසු ක්‍රමවේදයක් තිබිය යුතු ය. ඒ අනුව, දරුවාගේ මූලික අවශ්‍යතා තෘප්ත නොවන බව පැහැදිලි වන අතර, අනෙකුත් අවශ්‍යතා තෘප්ත වීම සඳහා මෙම මූලික අවශ්‍යතා අනිවාර්යයෙන් තෘප්ත විය යුතු ය. ඒ අනුව, ප්‍රායෝගික ව මෙන් ම, න්‍යායාත්මක ව මෙම තත්ත්වය ගැටලුවක් බව හඳුනා ගත හැකි ය.

3. ආයතන ගත දරුවන් සංඛ්‍යාවට සාපේක්ෂ ව ආයතනයේ නිලධාරීන් සංඛ්‍යාව අවම වීම

අභය ළමා නිවසෙහි මේ වන විට නිලධාරීන් 14 දෙනෙකු සේවය කරන අතර, සේවය ලබා ගන්නා දරුවන් සංඛ්‍යාව 24කි. ඊට අමතර ව ළමා මවක් ද මෙම ආයතනයේ රැකවරණය ලබයි. ඒ අනුව, වයස අවුරුදු 0 - 5 දක්වා වයස් කාණ්ඩයට අයත් දරුවන් මෙම ආයතනයේ සේවය ලබා ගන්නා බැවින්, ඔවුන් වෙනුවෙන් එක දරුවෙක් සඳහා එක රැකවරණය සපයන්නෙක් ආදී වශයෙන් විශේෂ රැකවරණයක් අවශ්‍ය බව පැහැදිලි වන අතර, සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ. විශේෂයෙන් ම, මීට පෙර, මෙහි සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් පුරප්පාඩු ඇති වී ඇති අතර, ඉතා ම සුළු සේවක සංඛ්‍යාවක් සමඟ මෙම ආයතනය පවත්වා ගෙන යාමට සිදු වූ බව මෙම ආයතනය භාර නිලධාරිණිය විසින් ආයතන අධ්‍යයනය අතරතුර අප ව දැනුවත් කළ අතරම ඒ අවස්ථාවේ දී, වෙනත් රජයේ ආයතන වලින් දරුවන් රැක බලා ගැනීම සම්බන්ධයෙන් නිසි

පුහුණුවක් නොමැති නිලධාරීන් පවා බඳවා ගැනීමට සිදු වූ බව පැහැදිලි කරන ලදි. ඒ අනුව, සේවය කරන නිලධාරීන්ගේ ගුණාත්මක බව පිළිබඳ ව ද ගැටලු පවතියි.

මෙහි දී විශේෂයෙන්ම, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විසින් පුද්ගල සංවර්ධනය පිළිබඳ ව ඉදිරිපත් කරන ලද, මනෝ-ලිංගික සංවර්ධන න්‍යායය තුළ මතු කරන කරුණු වැදගත් වේ. එනම්, ෆ්‍රොයිඩ් ගේ න්‍යායයට අනුව නිසි පරිදි සංවර්ධන අවධි තුළ සංවර්ධනය වීමට අවස්ථාව නො ලද පුද්ගලයෙකු ට පසු කාලීන ව පෞරුෂ අක්‍රමිකතා ඇතුළු ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදු විය හැකි අතර, මෙම ආයතනය තුළ ගත කරන දරුවන් ඔවුන්ගේ, මුඛ අවධිය, පායුක අවධිය, ලිංග රූප අවධිය යන සංවර්ධන අවධි පසු කරමින් සිටින නිසා, ඔවුන්ගේ සංවර්ධනය නිසි පරිදි සිදු වීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

ඒ අනුව, අඩු සේවක සංඛ්‍යාවක් සහිත ව පවත්වා ගෙන යන මෙම ආයතනය තුළ, දරුවෙකුට එක් එක් අවධි සාර්ථක ව පසු කර ගෙන යාම සඳහා අවස්ථාව පවතින්නේ ද යන්න සලකා බැලිය යුතු ය. ෆ්‍රොයිඩ් ට අනුව, උපතේ සිට අවුරුදු දෙක දක්වා කාලය, මුඛ අවධිය වන අතර මෙම කාලය තුළ දී දරුවා මුඛය ආශ්‍රිත ක්‍රියා එනම් මව් කිරි බීම, ඇඟිලි ඉරීම, කෙළ පිම්බීම වැනි ක්‍රියා වල යෙදීමෙන් තෘප්තිමත් වේ. ඉන් අනතුරුව එළඹෙන වසර දෙකේ සිට තුන දක්වා කාලය, පායුක අවධිය ලෙස හඳුන්වන අතර මෙම අවධියේ දී සමාජීය වශයෙන් ලැබෙන විවිධ නියෝග අනුව ජීවත් වීමට දරුවා ඉගෙන ගනියි. උදාහරණයක් වශයෙන් දරුවෙකු මළ මූත්‍රා පහ කිරීම පාලනය කර ගැනීමට ඉගෙන ගන්නේ මෙම අවධිය තුළ ය (Liyanage,2021).

ආයතන ගත දරුවන් වන බැවින්, මවගෙන් කිරි බීම සඳහා අවස්ථාවක් නොමැති අතර, ඒ සඳහා දරුවා මුඛය ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් තෘප්තිමත් කිරීම සඳහා වෙනත් විකල්ප ක්‍රමවේද අවශ්‍ය ය. කුසගිනි වී හඬන විට ආයතනයේ නිලධාරියෙක් විසින් බෝතලකින් කිරි පෙවීම සඳහා සූදානම් ව සිටිය යුතු අතර,ඒ සඳහා ප්‍රමාණවත්, නිසි දැනුම, කුසලතා හා පුහුණුව සහිත නිලධාරි මණ්ඩලයක් සිටිය යුතු ය. එසේ නොමැති නම්, තම අවශ්‍යතා ඉටු නොවන විට දරුවා සමාජය විශ්වාස නො කරන සමාජයට පහසුවෙන් අනුකලනය නොවන පෞරුෂයක් සහිත පුද්ගලයෙකු බවට පත් විය හැකි ය.

එමෙන් ම, දරුවෙකුගේ සංවර්ධනය සඳහා පායුක අවධිය ද වැදගත් වන අතර, විශේෂයෙන් ම, මෙම අවධියේ දී, තම අවශ්‍යතා පාලනය කර ගැනීමට බල කිරීම මෙන් ම, ඒ සම්බන්ධයෙන් වඩාත් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් දරුවෙකුගේ සංවර්ධනය සම්බන්ධයෙන් සුදුසු නොවන බව ෆ්‍රොයිඩ් පෙන්වා දෙන අතර, විශේෂයෙන් ම, ආයතනය නඩත්තු කිරීමේ පහසුව සඳහා, මෙම කුඩා දරුවන්ගේ ශාරීරික අවශ්‍යතා දැඩි ලෙස පාලනය කිරීමට ආයතනය නිලධාරීන් යොමු වීම හෝ දරුවන් නොසලකා හැරීමට භාජනය කිරීම නිසා පාලනයකින් තොර වීම යන අන්ත දෙක ම දරුවෙකුගේ පෞරුෂ වර්ධනය සඳහා නුසුදුසු ය.

අවුරුදු තුන සිට හත දක්වා කාලය ලිංග රූප අවධිය ලෙස නම් කරන අතර මෙම අවධියේ දී දරුවා කාන්තාවන් හා පිරිමින් අතර ඇති කායික වෙනස්කම් පිළිබඳ ව දැනුවත් වන අතර ලිංගිකත්වය පිළිබඳ අවබෝධය වර්ධනය කර ගනියි. මෙම අවධිය

තුළ ෆ්‍රොයිඩ් විසින් ඊඩිපස් සංකීර්ණය එනම් පුත්‍රයා, තම පියා අනුගමනය කිරීම හා තම මවට ආකර්ෂණය වීම හා ඉලෙක්ට්‍රා සංකීර්ණය එනම් දියණිය තම මව අනුගමනය කරමින් තම පියාට ආකර්ෂණය වීම ගොඩනැගෙන බව පෙන්වා දෙයි ( Liyanage,2021).

ආයතන ගත දරුවන්ට දෙමාපිය රැකවරණය අහිමි නමුත්, SOS ළමා ගම්මානය වැනි ළමා රැකවරණ මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරන, සෑම දරුවෙකු ම මවක් සමග සම්බන්ධ කිරීම හා, සුදුසුකම් සහිත පුද්ගලයන් හරහා පියෙකුගේ වැනි රැකවරණය ලබා දීම හරහා අනාගතයේ වඩා සමබර පෞරුෂයක් සහිත දරුවෙක් ගොඩ නැගීම සඳහා ශක්තිමත් පදනමක් සකස් කළ හැකි අතර, ඒ සඳහා කාර්ය මණ්ඩලය සඳහා සුදුසුකම් සහිත ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් ඇතුළත් නො වීම ගැටලුවක් බව  පැහැදිලි ය.

4. දරුවන් රැක බලා ගන්නා නිලධාරීන් ට ළමා සංවර්ධනය පිළිබඳ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගත හැකි අවස්ථා සීමිත වීම

මෙම ආයතනය තුළ රැකවරණය ලබන වයස් කාණ්ඩය ට අයත් දරුවන්ගේ සංවර්ධනය ට ප්‍රධාන වශයෙන් බලපෑම් සිදු කරන සාධකයක් වශයෙන් එම දරුවන්ට රැකවරණය සලසන්නා හඳුනා ගත හැකි ය. උදාහරණයක් වශයෙන්, එරික් එරික්සන්ගේ මනෝ- සමාජීය සංවර්ධන අවධි න්‍යායය සලකා බැලුවහොත්, අභය ළමා නිවස තුළ වෙසෙන දරුවන්, හැකි ඉක්මනින් කුල වද්දා ගැනීමට හෝ වෙනත් ආකාරයකට සමාජ ගත කිරීමට කුමන හෝ හේතුවක් මත නො හැකි වුවහොත්, එවැනි දරුවෙකුගේ, ළදරු විය (වයස අවුරුදු 0-1.5), පූර්ව ළමා විය (වයස අවුරුදු 1.5 - 3) හා පෙර පාසල් අවධිය (වයස අවුරුදු 3-5) යන සංවර්ධන වයස් කාණ්ඩ 3 මෙම ආයතනය තුළ ගත වේ.

පුද්ගලයෙකුගේ ජීවිතයේ වඩාත් තීරණාත්මක සංවර්ධන අවධි ත්‍රිත්වයක් ලෙස සැලකිය හැකි ඉහත සඳහන් කළ වයස් කාණ්ඩ වල දී, දරුවාට රැකවරණය සලසන්නා ප්‍රධාන භූමිකාවක් රඟ දක්වයි. උදාහරණයක් වශයෙන්, ළදරු වියේ දී, ළදරුවා හා සමීප ව කටයුතු කරන පුද්ගලයා (Caregiver) සමඟ පවත්වනු ලබන සම්බන්ධතාවේ ස්වභාවය අනුව, තම අවට ලෝකය පිළිබඳ ව මෙන් ම වෙනත් පුද්ගලයන් සම්බන්ධයෙන් ද විශ්වාසයක් හෝ අවිශ්වාසයක් ගොඩ නගා ගැනීම මේ අවධියේ දී සිදු වන බව එරික්සන් පෙන්වා දෙයි (Erikson’s stages of psychosocial development - NCBI bookshelf, n.d.). ඒ අනුව, ආරක්ෂාකාරී පරිසරයක් තුළ, මව හෝ ළදරුවාට ඉතා සමීප ව රැක බලා ගන්නා පුද්ගලයා විසින් නිරන්තර අවධානය සහිත උණුසුම් සම්බන්ධතාවක් පවත්වා ගෙන යන ළදරුවන් අවට ලෝකය ආරක්ෂිත ස්ථානයක් ලෙස හඳුනා ගනිමින් අනාගතයේත් පුද්ගල සම්බන්ධතා ධනාත්මක ලෙස පවත්වා ගෙන යන බවත්, හුදකලා අනාරක්ෂිත පරිසරයක වෙසෙන දරුවන් තුළ අවට ලෝකය හා පුද්ගලයන් පිළිබඳ ව අවිශ්වාසය ගොඩ නැගෙන බවත් මෙම න්‍යායයෙන් පෙන්වා දෙයි.

ඒ අනුව, මෙම ආයතනයේ සේවය කරන නිලධාරීන් විසින් මේ සම්බන්ධ අවබෝධයකින් තොර ව හෝ, නිලධාරි මණ්ඩලය ප්‍රමාණවත් නො වීම හෝ වෙනත් හේතුවක් මත මෙම අවධියේ මනෝ- සමාජීය සංවර්ධනය නො සලකා හැරියහොත්, එම දරුවා අනාගතයේ සමාජය අවිශ්වාස කරන, හුදකලා මෙන් ම, සමාජ සම්බන්ධතා ඇති කර ගෙන පවත්වා ගෙන යා නො හැකි දරුවෙකු බව ට පත් වීමේ අවදානමක් පවතියි.

පූර්ව ළමා වියේ දී, දරුවන් තමා හඳුනා ගැනීමට උත්සාහ කරනු ලබන අතර, තම සිරුර ගවේෂණයට පෙලඹෙයි. තමාට, තමා ම විය හැකි දැයි ප්‍රශ්න කරනු ලබයි. මෙම අවස්ථාවේ දී, තමාව ම ගවේෂණය කිරීම සඳහා අවස්ථාව හිමි වන්නේ නම්, එම දරුවන් තුළ ආත්ම විශ්වාසය වර්ධනය වන අතර, තමා ව ගවේෂණය සඳහා අවස්ථාව නො ලැබෙන දරුවන් තුළ ලැජ්ජාවක් හා තමා පිළිබඳ ව ම අවිශ්වාසයක් වර්ධනය වේ (Erikson's stages of psychosocial development - NCBI bookshelf, n.d.). මේ අවස්ථාව වන විට දෙමාපියන් දෙදෙනාගේ ම භූමිකාව දරුවාට ඉතා ම වැදගත් වේ.

ඒ අනුව, විශේෂයෙන් ම, පූර්ව ළමා වියේ දී, එරික්සන් විසින් දෙමාපියන් දෙදෙනාගේ ම භූමිකාවේ වැදගත්කම අවධාරණය කරනු ලබන අතර, තමා ව ගවේෂණය කිරීමට ලැබෙන අවස්ථාව මත දරුවා තුළ විශ්වාසය වර්ධනය වන බව පෙන්වා දෙයි. ආයතන ගත දරුවන් ට මුහුණ දීමට සිදු වන තවත් ගැටලුවක් ලෙස මෙම තත්ත්වය හඳුනා ගත හැකි අතර, දෙමාපියන් දෙදෙනා ම නොමැති වීම තුළ, තමා ව ගවේෂණය කිරීමට අවස්ථාව නො ලැබී යාමත්, ඒ හේතුවෙන් ඔවුන් තුළ ලැජ්ජාව හා තමා පිළිබඳ අවිශ්වාසය වර්ධනය වීමත් හේතුවෙන් අනාගතයට සාර්ථක ලෙස සූදානම් වීමේ අවස්ථාව ගිලිහී යාමේ ඉඩක් පවතියි.

පෙර පාසල් අවධිය වන විට, නැවුම් දේ අත්හදා බැලීමට, යමක් අලුතින් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන අතර, උදාහරණයක් වශයෙන් රවුම් යමක් පෙරළීම වැනි මූලික සිද්ධාන්ත අධ්‍යනය කරනු ලබයි. මෙම අවස්ථාවේ දී, තමා සිදු කරන දේ සිදු කිරීම තමාට ගැටලුවක් වේද? යන්න ප්‍රශ්න කරනු ලබයි. මෙම අවස්ථාවේ දී, දරුවන් ධෛර්යමත් කරන්නේ නම්, එම දරුවන් තම අරමුණු කරා සාර්ථක ලෙස ගමන් කරන අතර, දරුවන් අධෛර්යමත් හෝ දරුවා සිදු කරන ක්‍රියාකාරකම් නො වැදගත් බව හඟවා නො සලකා හරින්නේ නම්, එම දරුවන් තුළ වරදකාරිත්වය වර්ධනය වේ. මෙම අවස්ථාව වන විට දරුවා අයත් වන පවුලේ සාමාජිකයන් සියලු දෙනා ම දරුවාගේ වර්ධනය සම්බන්ධයෙන් වැදගත් භූමිකාවක් රඟ දක්වයි.

පෙර පාසල් අවධිය වන තෙක්, යම් දරුවෙක් මෙම ආයතනයේ රැඳී සිටින්නේ නම් එම දරුවාගේ පවුලේ සාමාජිකයන් බවට නැතහොත් දරුවා සමඟ සමීපතම සම්බන්ධතා පවත්වා ගෙන යන පුද්ගලයන් (පාරිසරික පද්ධති න්‍යායය, යූරි බ්‍රොන්ෆෙන්බ්රෙනර් - ක්ෂුද්‍ර පද්ධතිය හා මධ්‍ය පද්ධතිය ( Liyanage, 2021)) බවට මෙම කාර්ය මණ්ඩලය පත් වන බව පැහැදිලි අතර, එවැනි අවස්ථාවක දරුවාගේ ක්‍රියාකාරකම් අගය කරමින්, එම දරුවා දිරිමත් කරන්නේ නම්, එවැනි අවස්ථාව වල දරුවන් සාර්ථකත්වය කරා ගමන් කිරීමට පෙලඹීමක් ඇති වන බවත්, එසේ

නොමැති ව, දරුවාගේ ක්‍රියා නො සලකා හරින්නේ නම් හෝ අධෛර්යමත් කරන්නේ නම් එවැනි දරුවන් තුළ වරදකාරිත්වය ගොඩ නැගෙන බවත් පැහැදිලි වේ.

මේ අනුව, ළමා සංවර්ධනය පිළිබඳ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීමට මෙම ආයතනයේ සේවය කරන නිලධාරීන්ට අවම වශයෙන් එක වසරකට එක වරක් හෝ අවස්ථාව ලබා දීම වඩාත් වැදගත් වන අතර, කුල වද්දා ගන්නා තෙක් හෝ, නිසි පරිදි සමාජ සේවා නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සමාජ ගත කරන තෙක් හෝ වයස සම්පූර්ණ වන විට සුදුසු වෙනත් ආයතනයකට යොමු කරන තෙක් හෝ දරුවාගේ වර්ධනය සඳහා අවශ්‍ය පදනම සකස් කිරීමට, මෙම දරුවන් වෙනුවෙන් උපරිම සේවයක් ඉටු කිරීමට ආයතනයේ නිලධාරීන්ට අවස්ථාව හිමි වේ.

5. විවිධ හේතු මත දරුවන්ගේ නිවාස ගත කාලය දීර්ඝ වීම

අභය ළමා නිවසට අධිකරණ නියෝග මත ඇතුළත් කරන දරුවන්, DNA පරීක්ෂණ හරහා පියා තහවුරු කර ගැනීම වැනි නඩු කටයුතු වලට මැදිහත් වී සිටින අතර, අධිකරණ කාර්ය පටිපාටිමය හේතු මත එවැනි නඩු කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත වීම සිදු වේ. මීට අමතර ව, අධිකරණ නියෝග හේතුවෙන් මෙන් ම, මව හෝ පියා යන දෙපාර්ශවයෙන් එක පාර්ශවයක් දරුවා කුල වද්දා ගැනීම සඳහා යොමු කිරීමට අකමැති වීම හා, දරුවා භාර ගැනීමට තරම් සුදුසු සමාජ සංස්කෘතික හා ආර්ථික පසුබිමක් නො තිබීම වැනි හේතු මත දරුවා නිවාස ගත ව ගත කරන කාලය දීර්ඝ විය හැකි ය. එවැනි අවස්ථා වල දරුවන් ට, දීර්ඝ කාලයක් ආයතනයේ රැඳී සිටීමට සිදු වන අතර, මෙම තත්ත්වය දරුවාගේ සංවර්ධනය ට අහිතකර ලෙස බලපෑමේ අවදානමක් තිබේ.

6. ආයතනය තුළ ළමා කායික හා මානසික සංවර්ධනය සඳහා ඇති වැඩසටහන් සීමිත වීම හා දරුවන් නඩත්තුව පහසු වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් ළමා සංවර්ධනයට බාධා සිදු වීම

ආයතන ගත දරුවන් තුළ ප්‍රධාන වශයෙන්, අනුකරණය සඳහා දෙමාපියන් හෝ වැඩිහිටියන් නොමැති වීම හේතුවෙන් ස්වයං ප්‍රතිරූපය පිළිබඳ ව, සමාජයට අනුගත වීම පිළිබඳ ව හා සන්නිවේදනය පිළිබඳ ව ගැටලු අනිවාර්යය වන අතර, ජීවන කුසලතා පිළිබඳ ගැටලු මෙන් ම, තම අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් ප්‍රචණ්ඩ ආක්‍රමණශීලී හැසිරීම් රටාවක් ප්‍රකට කළ හැකි ය. මෙවැනි ගැටලු කළමනාකරණය කර ගැනීම සඳහා උචිත වැඩසටහන් අවශ්‍ය වන අතර, එවැනි වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම ද ඉහළ විය යුතු ය. කෙසේ නමුත්, ආයතනය තුළ මෙවැනි වැඩසටහන් නොමැති වීම ගැටලුවකි.

එමෙන් ම, මෙහි දී, ලෝරන්ස් කෝල්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද, සදාචාරාත්මක සංවර්ධන න්‍යායය ද වැදගත් වන අතර, සදාචාරාත්මක වර්ධනයේ පළමු අදියර වන පූර්ව සම්ප්‍රදායික අවධියේ දී, දරුවන්ට පුද්ගලික සදාචාර සංග්‍රහයක් නොමැති අතර, ඒ වෙනුවට සදාචාරාත්මක තීරණ වැඩිහිටියන්ගේ ප්‍රමිති අනුව හැඩ ගැසී ඇති බව හඳුනා ගත හැකි ය. එනම්, දරුවන් වැඩිහිටියන් පනවා ඇති නීති රීති බිඳ දැමීමේ

ප්‍රතිවිපාකය පමණක් සලකා සදාචාරය නිර්ණය කර ගනියි. උදාහරණයක් වශයෙන්, යම් ක්‍රියාවක් දඬුවමට මඟ පාදන්නේ නම් එය අයහපත් විය යුතු අතර, එසේ නොමැති නම්, එය යහපත් ක්‍රියාවක් විය යුතු ය ( Mcleod, 1970). ඒ අනුව, ආයතනයේ නඩත්තුව පහසු කිරීම සඳහා දරුවන් විෂයයෙහි පනවා ඇති නීති රීති දරුවෙකුගේ සදාචාරය වර්ධනය වීමේ දී නැතහොත්, අනාගතයේ දී, යම් සිදු වීමක නිරවද්‍ය බව වටහා ගැනීමේ දී අහිතකර ලෙස බලපෑම් සිදු කළ හැකි බව පැහැදිලි වේ.

**6.3. යෝජනා කරන නවීකරණ**

1. එරික් එරික්සන් විසින් පැහැදිලි කළ මනෝ-සමාජීය සංවර්ධනයට, ෆ්‍රොයිඩ් විස්තර කළ, මනෝ-ලිංගික සංවර්ධන අවධි වල සංවර්ධනය ට මෙන් ම, කෝල්බර්ග් ඉදිරිපත් කළ සදාචාර සංවර්ධනයට බාධා නොවන ආකාරයේ පරිපාලන ක්‍රමවේදයක් සකස් කිරීම

2. ආයතනයේ නඩත්තුව පහසු කර ගැනීම සඳහා දරුවන් විෂයයෙහි පනවා ඇති නීති රෙගුලාසි වෙනස් කිරීම

3. ගුණාත්මක සේවයක් ලබා දිය හැකි ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් ආයතනයට ඇතුළත් කර ගැනීම

4. සේවක මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුවක් ලබා දීම

5. ආයතනයේ පහසුකම් වර්ධනය කිරීම

6. ආයතන ගත දරුවන් මුහුණ දෙන පොදු ගැටලු කළමනාකරණය කර ගැනීම සඳහා උචිත වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් සිදු කිරීම

7. SOS ළමා ගම්මානය ඇසුරෙන් හඳුනා ගන්නා ලද සාධනීය සංකල්ප වන, සෑම දරුවෙකුට ම, මවක්, සහෝදර සහෝදරියන්, නිවසක් හා ගම්මානයක රැකවරණය ලබා දී (SOS Children's Villages Sri Lanka, n.d.) ආදිය මෙම ආයතනය තුළ ප්‍රායෝගික ව ස්ථාපනය කළ හැකි ආකාරය හඳුනා ගැනීම

8. පවුල් සංකල්පය ළමා නිවස තුළ ස්ථාපනය හා පවුලක සාමාජිකයන්ගේ තත්ත්වය හා කාර්ය කොටස් ළමා නිවසේ දරුවන් හා එම දරුවන් රැක බලා ගන්නා පුද්ගලයන් වෙත ආරෝපණය කිරීම

9. නිවාස මාතාවන්, අඛණ්ඩ වෘත්තීය පුහුණුව හරහා, වඩාත් වෘත්තීමය මට්ටමේ රැක බලා ගන්නන් බවට පත් කර ගැනීම

10. අභය ළමා නිවසෙහි පරිපාලන ව්‍යුහය තුළ, සමාජ වැඩ වෘත්තිකයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා තනතුරක් නොමැති අතර, ඒ අනුව, නව තනතුරක් ඇති කර ළමා සංවර්ධනය හා රැකවරණය විෂය පිළිබඳ පුහුණුවක් ලත් සමාජ වැඩ වෘත්තිකයෙකු ඒ සඳහා පත් කිරීම

11. සෑම දරුවෙකුගේ ම පෞද්ගලික අවශ්‍යතා හඳුනා ගෙන තනි පුද්ගල සංවර්ධන සැලැස්මක් සකස් කිරීම, එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා එම දරුවන්ට අවශ්‍ය පෞද්ගලික, චිත්තවේගී හා මනෝ- සමාජීය සහය ලබා දීම හා පසු විපරම් කිරීම

12. දරුවන් සමාජ ගත කිරීමේ ස්ථාපන කමිටුව හා කුල වද්දා ගැනීමේ කමිටුව සඳහා ආයතනයට බඳවා ගත් සමාජ වැඩ වෘත්තිකයා ඇතුළත් කර ගැනීම හා පරිවාස නිලධාරියාට අමතර ව සමාජ වැඩ වෘත්තිකයාගේ නිර්දේශ ලබා ගැනීම

13. ළමා නිවස පාලනය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ දී, සමාජ වැඩ, ළමා සංවර්ධනය, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයයන් හදාරා තිබීම අනිවාර්ය කිරීම

14. ළමයාගේ උපරිම යහපත සලකා, දරුවන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා, බාලක යුක්තිය පසිඳලීමේ අධිකරණ කාර්ය පටිපාටිය සංශෝධනය කිරීම

7. නිගමනය

මෙහි දී අභය ළමා නිවස ඇසුරෙන් භාර ගැනීමේ නිවාස සම්බන්ධයෙන් සමාජ වැඩ න්‍යායයන්, මූලධර්ම, ඇගයුම් භාවිතා කරන ආකාරය, ආයතනයේ ශක්‍යතා හා ගැටලු හඳුනා ගැනීම හරහා, එම ගැටලු වලට සමාජ වැඩ පරිචය තුළ යෝජනා කළ හැකි සාධනීය නවීකරණ ඉදිරිපත් කළ අතර, 2019 වසරේ සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප ජාතික ප්‍රතිපත්තියෙහි ඇතුළත් මූලධර්ම හා හරයන් පිළිබඳ ව අවධානය යොමු කරමින් අවසන් නිගමනය ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප ජාතික ප්‍රතිපත්තිය සලකා බැලීමේ දී, ඒ සඳහා පදනම් වූ ප්‍රධාන මූලධර්ම 2ක් හඳුනා ගත හැකි ය. එනම්, අවශ්‍යතා මූලධර්මය හා යෝග්‍යතා මූලධර්මය වේ. අවශ්‍යතා මූලධර්මයට විකල්ප රැකවරණය සඳහා දරුවෙකු යොමු කිරීම වැළැක්වීම ට උත්සාහ කරන යාන්ත්‍රණයන් ඇතුළත් වන අතර, යෝග්‍යතා මූලධර්මයට, දරුවෙකු විකල්ප රැකවරණය කෙරෙහි යොමු කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති නම්, එවැනි අවස්ථාවක දී කටයුතු කළ යුතු ආකාරය ඇතුළත් වේ (ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය, 2019).

කෙසේ නමුත්, මෙම මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ දී, දරුවාගේ උපරිම යහපත පළමු ව සලකා බැලෙන බව තහවුරු කිරීම, දරුවෙකුට පවුලේ රැකවරණය ලබා දීම සඳහා සියලු උත්සාහ දැරීම, දරුවාගේ ආරක්ෂාව හා සුබසාධනය තහවුරු කර ගැනීම, තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී, දරුවාගේ අදහස් විමසීම හා සිදු කිරීමට බලාපොරොත්තු වන වෙනස්කම් දරුවාට දැනුම් දීම, දරුවාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම, වෙනස් කොට නො සැලකීම, ජීවත් වීමට, සංවර්ධනයට හා ආරක්ෂාවට ඇති අයිතිය ආරක්ෂා කිරීම, දරුවා තම සංවර්ධනය සඳහා සහභාගී වීම යන හරයන් මත කටයුතු කළ යුතු අතර, නේවාසික රැකවරණය සඳහා අවම ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය හා ඇගයීම සිදු කළ යුතු ය (ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය, 2019).

මෙහි දී, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි ඇතුළත්, දරුවාගේ වර්ධනය සම්බන්ධයෙන් මෙන් ම, දරුවාගේ ජාතිය, සංස්කෘතිය හා භාෂාමය පසුබිම

පිළිබඳ සැලකිලිමත් වීම, දරුවාගේ පවුල් සංස්ථාවට, වඩාත් සමීප පරිසරයක දරුවා රැඳවීම, විකල්ප රැකවරණය ලබන දරුවන් හා දෙමාපියන් අතර සබඳතා දිරි ගැන්වීම, නිදහසට ඇති අයිතිය, සහෝදර සහෝදරියන් වෙන් නො කිරීම, දරුවා සම්බන්ධ තීරණ ගැනීමේ දී, එම දරුවාගේ සුවිශේෂී ගති ලක්ෂණ සලකා බැලීම වැනි කොන්දේසි කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු ය.

මේ අනුව, අභය ළමා නිවස, අවශ්‍යතා හා යෝග්‍යතා මූලධර්ම ද්විත්වය මත පදනම් ව, දරුවෙකුගේ රැකවරණය සඳහා විකල්පයක් නොමැති අවස්ථාවක, එම දරුවාගේ රැකවරණය සුරක්ෂිත කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයක් වන අතර, තව දුරටත්, අවම සම්පත් සහිත රාජ්‍ය ආයතනයක් වශයෙන්, ස්ථාපන කමිටු හා කුල වැද්දීමේ කමිටු හරහා මෙන් ම, ආයතනය තුළ නේවාසික දරුවන් වෙනුවෙන් සපයන වෙනත් සේවා හරහා ප්‍රතිපත්තිමය හරයන් ක්‍රියාවට නැංවීමට උත්සාහ කරන ආයතනයක් ලෙස හඳුනා ගත හැකි ය.

නමුත්, වයස අවුරුදු 5 ට වඩා අඩු දරුවන් සමඟ කටයුතු කරන බැවින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී, දරුවාගේ අදහස් විමසීම හා සිදු කිරීමට බලාපොරොත්තු වන වෙනස්කම් දරුවාට දැනුම් දීම වැනි අයිතිවාසිකම් දරුවා ට ලබා දීමට හැකියාවක් නොමැති නමුත්, දරුවන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී, දරුවාගේ උපරිම යහපත සලකා පාර්ශව කිහිපයක් එක් ව තීරණ ගනිමින් සමස්තයක් ලෙස දරුවන්ගේ අනෙකුත් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කරමින් කටයුතු කරන ආයතනයක් ලෙස හඳුනා ගත හැකි ය. ඉහත යෝජනා කරන ලද නවීකරණ හරහා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කෙරෙන පරිසරයක් තුළ සේවා සැපයීමට අවස්ථාව හිමි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ගම්ලත්, S., හා අමරසේකර C, (2019) වෘත්තීය සමාජ වැඩ හා මැදිහත්වීම. කොළඹ 10: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව. (n.d.). Retrieved November 27, 2022, from https://healthmin.nc.gov.lk/si/department-of-probation/

සුබසිංහ, ඩබ්., 2016. සමාජ පර්යේෂණ ක්‍රම. ගණේමුල්ල: කතෘ ප්‍රකාශන.

ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය (2019), කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යංශය, පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව

*Census of children in child care institutions 2019 Final Report* (Rep.). (2021). Department of Census and Statistics In collaboration with Department of Probation and Child Care Services.

Department of Probation and Child Care Services. (n.d.). Retrieved November 28, 2022, from http://www.probation.gov.lk/index_e.php

Erikson's stages of psychosocial development - NCBI bookshelf. (n.d.). Retrieved November 16, 2022, from https://www.ncbi.nlm.nih.gov/books/NBK556096/

Global definition of Social Work. (n.d.). Retrieved November 29, 2022, from https://www.ifsw.org/what-is-social-work/global-definition-of-social-work/

Liyanage, L. (2021). Psychology for Social Work. Lecture 4, National Institute of Social Work

Mcleod, S. (1970, January 01). [Kohlberg's theory of moral development]. Retrieved November 21, 2022, from https://www.simplypsychology.org/kohlberg.html

Mcleod, S. (2020, December 29). Maslow's hierarchy of needs. Retrieved November 29, 2022, from https://www.simplypsychology.org/maslow.html#:~:text=There%20are%20five%20levels%20in,esteem%2C%20and%20self%2Dactualization.

SOS Children's Villages Sri Lanka. (n.d.). Retrieved November 15, 2022, from https://www.soschildrensvillages.lk/

Super-admin. (2014). Children and young persons ordinance: Volume II. Retrieved November 28, 2022, from https://www.srilankalaw.lk/Volume-II/children-and-young-persons-ordinance.html

Teenage pregnancies on the rise in Sri Lanka. (n.d.). Retrieved November 28, 2022, from https://www.yowunpiyasa.lk/index.php?option=com_content&view=article&id=49%3Ateenage-pregnancies-on-the-rise-in-sri-lanka&catid=16%3Awhat-s-new&Itemid=119&lang=en